# තංගල්ල ප්‍රාදේශීය සභාව.

# හම්බන්තොට දිස්ත්‍රික්කය.

01. මූල්‍ය ප්‍රකාශන.

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2011 මාර්තු 31 දිනද , ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2010 මාර්තු 31 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

1.2 මතය.

මාගේ පරීක්ෂණයේ පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව තංගල්ල ප්‍රාදේශීය සභාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම් හැර 2010 දෙසැම්බර් 31 දිනට තංගල්ල ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදු සම්මත ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.

(අ) සමාලෝචිත වර්ෂයේදී , රු. 753,012 ක් වටිනා ස්ථාවර වත්කම් 07 ක් සඳහා දරන ලද වියදම් , වත්කම් ගිණුම් හරකර ප්‍රාග්ධනයෙන් ආදායමට දායක වීමේ ගිණුම බැරකර නොතිබුණි.

(ආ) වැය ශීර්ෂයන් 03 කට අදාලව ප්‍රධාන ලෙජරය අනුව එකතුව රු. 10,734,000 ක් වූ අතර, වැය ලේඛනය අනුව එකතුව රු. 10,154,758 ක් විය. ඒ අනුව රු. 579,242 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී වියදම් අයිතම 03 ක් සඳහා එකතුව රු. 169,860 ක් වු මුදලක් අදාල වැය ශීර්ෂයට හර කර නොතිබුණි.

(ඈ) ගෙවීම් මුදල් පොතට අනුව වවුචර් 11 කින් රු. 157,158 ක් ගෙවා තිබුණද , එම ගෙවීම් ප්‍රධාන මුදල් පොතට සටහන් වී නොතිබුණි.

(ඉ) සේවක ණය වාරික සඳහා 2010 දෙසැම්බර් 31 දිනට රු. 1,750 ක වැඩියෙන් අයවී තිබුණු අතර, එම මුදල ශේෂ පත්‍රයේ ජංගම බැරකම් ලෙස නොපෙන්වා හිඟ සේවක ණය ශේෂයෙන් අඩුකර පෙන්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති තොග ශේෂය රු. 391,851 ක් වුවද, තොග ලේඛනය වලට අනුව එම ශේෂය රු. 845,307 ක් විය. ඒ අනුව රු. 453,456 ක තොග අඩුවෙන් ශේෂ පත්‍රයේ දක්වා තිබුණි.

(උ) ගිණුම් තැබීමේ කටයුතු සඳහා යොදාගෙන තිබු ජර්නල් සටහන් වලට අදාල ගනුදෙනු හදුනාගත හැකිවන පරිදි ප්‍රමාණවත් තොරතුරු ජර්නල් සටහන් සමඟ ඉදිරිපත් කර නොතිබුණි.

1.3.2 <u>ගෙවිය යුතු ගිණුම්</u>.

2010 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබ ගෙවිය යුතු ගිණුම් ශේෂ වල වටිනාකම රු. 635,795 ක් විය.

1.3.3 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම.</u>

(අ) <u>පිළිතුරු නොලත් විගණන විමසුම්.</u>

2010 දෙසැම්බර් 31 දිනට විගණන විමසුම් 07 කට පිළිතුරු ඉදිර්පත් කර නොතිබු අතර , එකී විමසුම් වලට භාජනය වු ගණනය කල හැකි ගණුදෙනු වල වටිනාකම රු. 946,279 ක් විය. පිළිතුරු නොලත් විගණන විමසුම් වල කාල විශ්ලේෂණ පහත සඳහන් පරිදි වේ.

| | |
|---|---|
| මාස 03 ට අඩු | 04 |
| මාස 03 සිට අවුරුදු 01 දක්වා | 03 |

(ආ) <u>තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම.</u>

ස්ථාවර තැන්පත් ලේඛනය හා ශේෂ තහවුරු කිරීම් ලිපි නොමැතිවීම නිසා රු. 1,437,058 ක බැංකු තැන්පතුද උපයෝගී ලේඛන හා උපලේඛන නොමැතිවීම නිසා රු. 635,795 ක් වූ කර්මාන්ත ණය හිමියන්ද විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

1.3.4 <u>අනුකූල නොවීම්.</u>

(ආ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් <u>රෙගුලාසි සංග්‍රහයෙ</u>1645 හා 1646විධිවිධාන අනුව මාසික වාහන සංසිද්ධි සාරාංශ සමඟ දෛනික ධාවන සටහන් පත් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුළදී වාහන12 ක ධාවන සටහන් ඉදිරිපත් කර නොතිබුණි.

02. <u>මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය.</u>

2.1 <u>මූල්‍ය ප්‍රතිඵලය.</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනව , 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු: 23,330,053 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු: 6,105,322 ක් විය.

2.2 ආදායම් පරිපාලනය.
------------------------

2.2.1 <u>ඇස්තමේන්තුගත ආදායම් , තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්</u>.

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම් , තථ්‍ය ආදායම් හා හිඟ ආදායම පිළිබඳ තොරතුරු ඇමුණුමෙහි දැක්වේ.

| ආදායම් විෂයය | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| වරිපනම් හා බදු | 23 | 8 | 70 | 24 | 13 | 28 |
| බදුකුලී | 3,556 | 3,763 | 459 | 3,452 | 3,188 | 666 |
| බලපත්‍ර ගාස්තු | 992 | 845 | 349 | 662 | 628 | 472 |
| සේවා සඳහා ගාස්තු | 5,000 | 2,060 | 2,479 | 7,000 | 18,667 | 3,333 |
| වරෙන්තු ගාස්තු හා දඩ මුදල් | 2,015 | 988 | 1,028 | 1,304 | 2,100 | 130 |
| වෙනත් ආදායම් | 61 | 147 | 280 | 147 | 0 | 366 |

2.2.2 උසාවි දඩ මුදල්

විවිධ ආඥා පනත් යටතේ මහේස්ත්‍රාත් අධිකරණය විසින් 2010 දෙසැම්බර් 31 දක්වා අයකර ප්‍රධාන ලේකම් වෙත එවා ඇති රු. 1,027,768 ක දඩ මුදල සභාවට ලැබිය යුතුව තිබුණි.

2.2.3 මුද්දර ගාස්තු.

2010 දෙසැම්බර් 31 දිනට රෙජිස්ට්‍රාර් ජනරාල් වරයාගෙන් රු. 2,479,421 ක මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි.

2.2.4 හිඟ ආදායම් අයකර ගැනීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතෙ විධිවිධානයන් අනුව හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. විස්තර පහත දැක්වේ.

(i) 134(3) වගන්තිය අක්කර බදු රු. 69,604 ක මුදලක් සහ

රු. 168,453 ක් වූ ව්‍යාපාරික බදු මුදලක් 2010 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබුණි.

| | | |
|---|---|---|
| (ii) | 150 (iv) වගන්තිය | හිඟ බලපත්‍ර ගාස්තු රු. 180,610 ක මුදලක් 2010 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබුණි. |
| (iii) | 153(1) වගන්තිය | සංවර්ධනය නොකල ඉඩම් සඳහා බදු පැනවීමේදී ඒ ඉඩමේ ප්‍රාග්ධන බිම් අගයෙන් 2% ක් නොඉක්මවන බද්දක් වාර්ෂිකව අයකරගත හැකිව තිබුණද එසේ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (iv) | 159 (i) වගන්තිය | හිඟ කඩකාමර කුලී රු. 470,380 ක මුදලක් 2010 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබුණි. |

## 2.3 වියදම් ව්‍යුහය

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂයට අදාල සභාවේ අයවැය ගත හා තථ්‍ය වියදම විචලනයන්ද සමඟ පහත දැක්වේ.

| වියදම් විෂයය | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| පුනරාවර්තන වියදම් | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| පෞද්ගලික පඩිනඩි | 15,541 | 14,310 | 1,231 | 13,892 | 12,529 | 1,363 |
| අනෙකුත් | 11,367 | 9,099 | 2,268 | 9,674 | 9,613 | 61 |
| උප එකතුව | 26,908 | 23,409 | 3,500 | 23,566 | 22,142 | 1,424 |
| ප්‍රාග්ධන වියදම් | 16,323 | 40,306 | (23,983) | 16,553 | 60,232 | (43,679) |
| මුළු එකතුව | 43,231 | 63,715 | (20,483) | 40,119 | 82,374 | (42,255) |

## 2.4 වත්කම් කළමණාකරණය

-----------------------------

2.4.1 ලැබිය යුතු ගිණුම්

2010 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.11,851,919 ක් වූ අතර,අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන්හි එකතුව රු.1,048,598 ක් විය.

2.4.2 අයවීමට ඇති සේවක ණය.

(අ) 2010 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය අත්තිකාරම් ශේෂවල එකතුව රු. 2,660,606 ක් වූ අතර, එකී ශේෂය තුළ අවුරුදු 02 ක කාලයක් ඉක්මවූ රු. 3,400 ක මුදලක් විය.

(ආ) 2009 ජනවාරි මස ස්ථාන මාරුවී ගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු. 158,148 ක් වූ සේවක ණය ශේෂය එකවර අය නොකොට වාරික වශයෙන් අයකර ගනු ලබන බව නිරීක්ෂණය විය.

2.4.3 අචල ජංගම වත්කම්.

2010 දෙසැම්බර් 31 දිනට අවු. 01 ක කාලයක් ඉක්මවා අචලව පවතින බැංකු ජංගම ගිණුම් 02 ක රු. 80,314 ක අක්‍රිය මුදල් ශේෂයක් විය.

2.5 අධිභාර

සමාලෝචිත වර්ෂය අවසාන වන විට ව්‍යවස්ථාපිත විධිවිධානයන්ට අනුකූලව මවිසින් පනවා ඇති අධිභාර වෙනුවෙන් රු. 29,690 ක මුදලක් අයකර ගත යුතුව තිබුණි.

2.6 මානව සම්පත් කළමණාකරණය

අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව.

(අ) 2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක ශ්‍රේණිය | අනුමත | තථ්‍ය |
|---|---|---|

| | | |
|---|---|---|
| මාණ්ඩලික | 01 | 01 |
| ද්විතීයික | 12 | 15 |
| ප්‍රාථමික | 17 | 20 |
| වෙනත් (අනියම්,තාවකාලික) | 03 | 35 |

(ආ) කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 28 , 28(i) , 28 (ii) හා පිළිවෙලින් 2006 අප්‍රේල් 10 , 2006 මැයි 10 , 2006 අගෝස්තු 01 දිනැති චක්‍රලේඛ අනුව , විධිමත් අනුමැතියක් ලබා නොගෙන සභාව විසින් ආදේශක සේවකයින් 35 දෙනෙකු බඳවාගෙන සේවයේ යොදවා වැටුප් ගෙවා තිබුණි.

2.7 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා.</u>

(අ) වීථි පහන් නඩත්තු කටයුත සඳහා විදුලි කාර්මික වෙත නිකුත් කල බල්බ් ප්‍රමාණය හා ඔහු නඩත්තු කල බල්බ් ප්‍රමාණය අතර, විෂමතාවයක් සැම මාසයකම දැක්වුනු අතර, 2010 ඔක්තෝබර් 15 දිනට විදුලි කාර්මිකගෙන් ලබාගත් බල්බ් ප්‍රමාණයට වඩා බල්බ් 27 ක් වැඩිපුර නඩත්තු කර ඇති බව නිරීක්ෂණය විය. තවද විදුලි කාර්මික නිලධාරී විසින් පවත්වා ගනු ලබන වාර්තා වගකිව යුතු නිලධාරියෙකු අධීක්ෂණය කර නොතිබුණි.

(ආ) J.C.B. යන්ත්‍රය දින 12 ක් පැය 45.9 ක් සඳහා කුලියට ලබාදී තිබුණද , එසේ කුලියට ලබාදීම සඳහා වගකිව යුතු නිලධාරියෙකුගේ නියෝගයක් නොතිබුණි.

03. <u>පද්ධති හා පාලන.</u>

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පාලනය

(ඇ) ස්ථාවර වත්කම්

(ඈ) තොග පාලනය

(ඉ) වාහන පාලනය